## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

### ශාස්ත්‍ර පීඨය

### ශාස්ත්‍රවේදී තුන්වන වසර පරීක්ෂණය - ප්‍රථම සෙමෙස්තරය - 2016/2017

### SOC 3159 – උපදේශනයේ මූලික විධික්‍රම

පැ දෙකයි (02)

**I කොටස අනිවාර්ය වන අතර II කොටසින් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.**

---

### I කොටස

1. ආනන්ද අමිලා හා විවාහ වී අවුරුදු 20 ක් ගත වී ඇත. එනමුත් පසුගිය අවුරුදු 5 ක් තිස්සේ ඔහුට අමිලාට වඩා වයසින් බෙහෙවින් අඩු පෙම්වතියක සිටී. ඔහු අමිලාට කාරුණිකව සලකන අතර ඔවුන්ගේ නව යොවුන් වියෙහි පසුවන දරුවන් රැක බලා ගැනීමට උපකාරි වෙයි. අමිලා එක් දිනක ආනන්දගේ වංකභාවය පිළිබඳව දැන ගනී. ඇය දැඩිසේ ව්‍යාකුලත්වයට පත්වන අතර උපදේශකවරයකුට කතා කිරීමට තීරණය කරයි.

   (i) මෙම සිද්ධියේ මූලික ගැටලු මොනවාද?

   (ii) ඔබ උපදේශකවරයකු නම්, පන්තියේ උගත් උපදේශනය සම්බන්ධ න්‍යාය අතුරින් මෙම සේවාලාභියා සඳහා ඔබ උපයෝගි කර ගන්නා න්‍යාය කුමක්ද? ඔබේ තෝරා ගැනීම සම්බන්ධයෙන් හේතු පහදන්න.

   (iii) ගවේෂණය කිරීමට අවශ්‍ය වන්නා වූ වැඩිදුර තොරතුරු මොනවාද?

   (iv) පවතින ප්‍රශ්නය සමඟ කටයුතු කිරීමට නම් සේවාලාභියා වර්ධනය කරගත යුතු කුසලතා මොනවාද?

   (v) මෙම කුසලතා වර්ධනය සඳහා උපකාර කිරීමට ප්‍රයෝජනවත් වන්නා වූ ක්‍රියාකාරකම් හා ශිල්ප ක්‍රම මොනවාද?

*අ.පි.බ.*

## II කොටස

2. සේවාලාභියෙක්ට උපදේශකවරයකු අතින් හානි පැමිණවිය හැකි අවස්ථා තුනක් උදාහරණ සහිතව පහදන්න.

3. උපදේශකවරයෙක්ට තමාට වඩා වෙනස් සමාජ, ආර්ථික, අධ්‍යාපනික, ජනවාර්ගික සහ ආගමික පසුබිමක් සහිත සේවාලාභියකුට උපකාර කළ හැකිද? උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

4. "සහකම්පනය (Empathy) යනු උපකාර කරන්නා විසින් ඒකපාර්ශ්විකව පිරිනැමෙන දෙයක් නොව, සංවාදය ඔස්සේ අන්‍යොන්‍ය ලෙස ගොඩනැගෙන දෙයකි." උදාහරණ සහිතව මෙම ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

5. උපදේශකවරයා සේවාලාභියා වින්දිතයකු (victim) ලෙස නොදැකීම වැදගත් වන්නේ ඇයි දැයි පහදන්න.

6. සවන්දීම සහ සක්‍රීය සවන්දීම අතර වෙනස්කම් මොනවාද? උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

*****************